# හැඳින්වීම

සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ සම්බුද්ධත්වයට පත්ව තමන් අවබෝධ කර ගත් ධර්මයේ ශ්‍රේෂ්ඨත්වය හා ගම්භීරත්වය පිළිබඳ සිතුයේ, "මාවිසින් අවබෝධ කරන ලද ධර්මය ගැඹුරුය. දැකීමට දුෂ්කරය. අවබෝධය දුෂ්කරය. ශාන්තය. ප්‍රණීතය. තර්කයෙන් දත නොහැකිය. සියුම්ය. නුවණැත්තන් විසින් ම දත යුතුය"[1] යනුවෙනි.

මෙම ගම්භීර වූ ධර්මය බරණැස ඉසිපතන නම් මිගදායේ දී පංචවග්ගිය භික්ෂූන්ට ප්‍රථමයෙන් ම දේශනා කළහ. ධම්මචක්කපවත්තන සූත්‍රය අසා ධර්මාවබෝධය ලැබූ උන්වහන්සේලා අනත්තලක්ඛණ සූත්‍ර දේශනාවසානයේ අර්හත්වයට පත් වූහ. සංඝ සමාජයේ ආරම්භක සාමාජිකයන් වූ උන්වහන්සේලාගේ සාර්ථකත්වය හේතුවෙන් නොබෝ කලකින් ම දඹදිව පුරා බුද්ධ වචනය සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. බුදුරදුන්ගේ දේශනා පෙර නොඇසූ විරූ විශේෂ ධර්ම පද්ධතියක් හා ඊට අනුකූල වූ චරණ පද්ධතියක් හෙළි කළ හෙයින් "කිං කුසල ගවේසීව හා කිං සච්ච ගවේසීව" විසූ බොහෝ දෙනා ශාසනික මහණ උපසම්පදාව ලබා විමුක්ති මාර්ගයට පිළිපන්හ.

මෙසේ ආරම්භ වූ සංඝ සමාජය අවුරුදු විස්සක් පමණ යන තෙක් නිරබ්බුදව පැවතුණි. ඒ කාලයේ භික්ෂූන් තමන් වහන්සේගේ සිත් ගත් බවත්, ඒ අවධියේ භික්ෂූන්ට අනුශාසනා කිරීම් අවශ්‍ය නොවූ බවත්, සිහිකිරීම ම ප්‍රමාණවත් වූ බවත්, බුදුරදුන් ම දේශනා කොට තිබේ.[2] බුදුරදුන් මුල් යුගයේ භික්ෂූන් හික්මවූයේ ආඥාදායක ස්වරූපය ගත් විනය නීතිවලින් නොව සූත්‍ර ධර්මයන්හි සඳහන් සීලාදී ගුණයන් සිහිපත් කිරීමෙන්ය.

---

[1] අධිගතො බො මය්හායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො.
ම.පා i, බු.ජ.මු, (1957) 10 පිට

[2] ආරාධයිංසු වත මෙ භික්ඛවෙ භික්ඛු එකං සමයං චිත්තං .. න මෙ භික්ඛවෙ තෙසු භික්ඛුසු අනුසාසනී කරණීයා අහොසි. සතුප්පාදකරණීයමෙව මෙ භික්ඛවෙ තෙසු භික්ඛුසු අහොසි.
ම.නි i, බු.ජ.මු, (1964) 312 පිට

"මහණෙනි, දැන් තුඹලා ම ඒ ඒ දිශාවන්හි ඒ ඒ ජනපදයන්හි පැවිදි කරව්. උපසම්පදා කරව්"[3] යන අවසරය දීමත් සමඟ නා නා දේශයන්ගෙන්, නා නා ජනපදයන්ගෙන් සසුනට ඇතුළත් වූ පිරිස වර්ධනය විය. එසේ පැවිදි වූ පිරිස් අතර විමුක්ති සාධන පරමාර්ථය ඉවත දමා, විවිධ විෂම වූ අරමුණු ඇතිව පැවිදි වූ අය ද බොහෝ වූහ. එහෙයින් භික්ෂූන් සංවර විය යුත්තේ කෙසේ ද? යන්න සූත්‍ර දේශනා මගින් නිරන්තරව සිහිපත් කරන්නට බුදුරදුන්ට සිදු වුණි.

"මහණෙනි, ආර්ය සීලය, ආර්ය සමාධිය, ආර්ය ප්‍රඥාව හා ආර්ය විමුක්තිය යන කරුණුවලින් යුක්ත නොවූ භික්ෂුව මේ ශාසනයෙහි ගිලිහුණු (වැටුණු) පුද්ගලයෙකි"[4] යි සිහි කළේ සීල, සමාධි, ප්‍රඥා ත්‍රිශික්ෂාවෙහි හික්මීම පැවිද්දෙහි ඵලය බවයි.

එසේම කුහක සූත්‍රයේ දී "යම් භික්ෂුවක් කුහක වූවාහු, ක්‍රෝධය හා මානයෙන් දැඩි වූවාහු, තමන් හුවා දක්වන්නා වූ, කෙලෙස් සිඟු ඇත්තාහු, ඔසවා ගත් මාන නළ ඇත්තාහු, එකඟ සිත් නොලද්දාහු වෙත් ද, මහණෙනි, ඒ භික්ෂූහු මාමක නොවෙත්. ඔවුහු මේ ශාසනයෙන් බැහැර වූහ. ඔහු මේ ශාසනයෙහි වෘද්ධියට, විපුලත්වයට නොපැමිණෙත්"[5] යනුවෙන් දැක්වූයේ මෙවැනි ක්‍රියාවන්ට ඇතැම් භික්ෂූහු ගොදුරුව, ඒවායෙහි ඇලී ගැලී ජීවිකාව ගෙන ගිය නිසා යැයි සිතිය හැකිය.

කරුණු තුනක් නිසා භික්ෂුව තමා ම විනාශ වී නුවණැත්තන්ගේ ගර්හාවට ලක් වන බව බුදුරදුන් වදාළහ. එම කරුණු තුන නම්, සිත කය වචනයෙහි හික්මීමක් නැතිව ක්‍රියා කිරීම, බලවතුන් ආශ්‍රය කිරීම හා මිථ්‍යා දෘෂ්ටිවලින් යුක්ත වීමයි.[6] බලවතුන් ආශ්‍රය කරන භික්ෂුව ශ්‍රමණ සාරූප්‍යයට නොගැළපෙන ක්‍රියා කිරීමේ දීත්,

---

[3] අනුජානාමි භික්ඛවෙ, තුම්හෙවදානි තාසු තාසු දිසාසු, තෙසු තෙසු ජනපදෙසු පබ්බාජෙථ, උපසම්පාදෙථ.
ම.පා i, බු.ජ.මු, (1957) 46 පිට

[4] චතූහි භික්ඛවේ ධම්මෙහි අසමන්නාගතො ඉමස්මා ධම්ම විනයා පපතිතොති වුච්චති. කතමෙහි චතූහි ? අරියෙන සීලෙන ... අරියෙන සමාධිනා ... අරියාය පඤ්ඤාය ... අරියාය විමුත්තියා ... පපතිතොති වුච්චති.
අං. නි ii, බු.ජ.මු, (1962) 04 පිට

[5] යෙ තෙ භික්ඛවේ භික්ඛු කුහා ථද්ධා ලපා සිංගී උන්නළා අසමාහිතා, න මෙ තෙ භික්ඛවෙ භික්ඛු මාමකා අපගතා ච තෙ භික්ඛවේ භික්ඛු ඉමස්මා ධම්මවිනයා. න ච තෙ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජති.
අං. නි ii, බු.ජ.මු, (1962) 54 පිට

[6] තීහි ධම්මෙහි සමන්නාගතො පාපභික්ඛු ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං, බහුං ච අපුඤ්ඤං පසවති. කතමෙහි තීහි? ඉධ භික්ඛවෙ පාපභික්ඛු විසමනිස්සිතො ච හොති ගහනනිස්සිතො, බලව නිස්සිතො ච.
අං. නි i, බු.ජ.මු, (1960) 278 පිට

සමාජයට අහිත කර ක්‍රියා කිරීමේ දීත්, "බලවතුන් තමාව ආරක්‍ෂා කර ගනීවි" යන මානයෙන් මුලාවෙන් යුතුව එබඳු ක්‍රියාවන්හි නියැලෙන බව එහිදී මනාව විග්‍රහ කර ඇත.

ධම්මපදයේ සිවුරට සුදුසු පුද්ගලයාගේ හා නුසුදුසු පුද්ගලයාගේ ගති ලක්‍ෂණ දක්වා තිබේ. ඒ අනුව කෙලෙස්වලින් පිරිණු, ඉන්ද්‍රිය දමනයක් නැති අයෙකුට සිවුරක් දැරීමේ අයිතියක් නැත.[7] සීලයෙන් හා ඉන්ද්‍රිය දමනයෙන් යුත් අය පමණක් සිවුර දැරීමට සුදුසු වේ.[8]

ශාසනයේ අන්තර්ධානය පිළිබඳ දේශනා කරන බුදුරදුන් මේ ශාසනයෙහි භික්‍ෂූහු වරදවා ගත් සූත්‍රාන්ත, වරදවා ගත් පද ව්‍යඤ්ජන ඉගෙන ගනිත්. වරදවා ගත් පද ව්‍යඤ්ජනයන්ගේ අර්ථය දුර්වලය. මෙසේ දුර්වල අර්ථ ඇති ධර්මය දැරීම ශාසනයේ අන්තර්ධානය සඳහා බලපානු ලබන පළමු වන කරුණ බව දැක්වූහ. භික්‍ෂූහු අවවාද නොපිළිගැනීම ද එක් හේතුවකි. බහුශ්‍රැත ධර්මධර විනයධර මහ තෙරුන් වහන්සේලා පමණක් ධර්මය උගන්වති. අන් අය ඒ සඳහා පුරුදු නොකරති. මෙසේ ඔවුන් ඇවෑමෙන් එම ධර්මය අතුරුදහන් වෙයි. ස්ථවිර භික්‍ෂූහු බහුල ලෙස ප්‍රත්‍ය පිණිස පිළිපන්නෝ, ශික්‍ෂා ශාසනය ලිහිල් කොට ගනිත්. භාවනාවේ වෙර නොදරත්. නොපැමිණි මාර්ගඵලයන් ලබා ගැනීම පිණිස වීර්ය නොකරත්. මේ නිසා පශ්චිම ජනතාව ද මොවුන්ගේ දෘෂ්ටිය අනුව ම යයි.[9]

යථෝක්ත කරුණුවලට අනුව ශාසනය අන්තර්ධාන වන්නේ බාහිරව පැමිණෙන බලවේගයකින් නොව භික්‍ෂූන් වහන්සේලා අතර ම ඇති වන දුර්වලතා මත බව අවධාරණය කෙරෙයි. මෙම විවරණවලට අනුව භික්‍ෂු සමාජය සංකීර්ණ වීමෙන් භික්‍ෂු පරමාර්ථ ද වෙනස් වී ඇති බව දක්නට ලැබේ. භික්‍ෂු පිරිස දුශ්ශීලව,

---

7 අතික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති
අපෙතො දමසච්චෙන න සො කාසාවමරහති.
ඛු.නි i, බු.ජ.මු, (1960) 28 පිට

8 යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො
උපෙතො දමසච්චෙන ස වෙ කාසාවමරහති.
ඛු.නි i, බු.ජ.මු, (1960) 28 පිට

9 අං. නි ii, බු.ජ.මු, (1962) 284-286 පිටු

පාපයට බරව, නොසරුප් දේ කිරීම් හේතුවෙන් ශික්ෂාපද පැණවීමේ අවශ්‍යතාවක් ද පැන නැගුණි.

සැරියුත් තෙරුන් විසින් අසන ලද "ස්වාමීනි, කවර බුදුවරයන් වහන්සේලාගේ ශාසනයන් චිරස්ථායී වී ද, කවර බුදුවරයන් වහන්සේලාගේ ශාසනයන් චිරස්ථායී නොවී ද?" යන පැනයට බුදුරදුන් පිළිතුරු දුන්නේ, "කකුසඳ, කෝණාගම, කාශ්‍යප බුදුරජාණන් වහන්සේලාගේ ශාසනය චිරස්ථායී විය. විපස්සී, සිඛී, වෙස්සභූ බුදුරජාණන් වහන්සේලාගේ ශාසනය චිරස්ථායී නොවීය"[10] යනුවෙනි.

එහිදී විපස්සී, සිඛී, වෙස්සභූ බුදුරජාණන් වහන්සේලාගේ ශාසනය චිරස්ථායී නොවීමට හේතුකාරණා හතරක් බුදුරදුන් දැක්වූහ. එනම්,

1. සවිස්තරව ධර්ම දේශනා කිරීමට පසුබට වීම.
2. නවාංග ශාස්තෘශාසන සංඛ්‍යාත ධර්මය අල්පවීම.
3. ශ්‍රාවකයන් උදෙසා ශික්ෂාපද නොපැණවීම.
4. ප්‍රාතිමෝක්ෂය නොඋදෙසීම.[11]

මෙම පිළිතුරෙන් පසුව සැරියුත් තෙරුන් භික්ෂූන් උදෙසා ශික්ෂාපද පණවන ලෙස බුදුරදුන්ගෙන් අයැද සිටියහ. ඒ සඳහා උන්වහන්සේට ආරාධනා කළහ.

"භාග්‍යවතුන් වහන්ස, යම්හෙයකින් මේ ශාසනය දිගුකල් පවත්නක්, බොහෝ කල් පවත්නක් වන්නේ ද, එසේ භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවන සේක්වා. පාමොක් උදෙසන සේක්වා. භාග්‍යවතුන් වහන්ස, මෙය එයට කල් වෙයි. සුගතයන් වහන්ස, මෙය එයට කල් වෙයි"[12]

---

[10] පා.පා, බු.ජ.මු, (1959) 16 පිට

[11] පා.පා, බු.ජ.මු, (1959) 18 පිට

[12] එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙය්‍ය, උද්දිසෙය්‍ය පාතිමොක්ඛං යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකන්ති.
පා.පා, බු.ජ.මු, (1959) 22 පිට

එහිදී, බුදුරදුන් පවසන්නේ ශාසනය තුළ ආසවට්ඨානීය ධර්ම පහළ වන තුරු තමන් වහන්සේ භික්ෂූන්ට ශික්ෂාපද නොපණවන බවයි. ඒ සඳහා දැන් කල් නොවන බව ද දැක්වූහ.

"ශාරිපුත්‍රයෙනි, බලාපොරොත්තු වවු. ශාරිපුත්‍රයෙනි, බලාපොරොත්තු වවු. තථාගත තෙමේ ම එයට කල් දන්නේය. ශාරිපුත්‍රයෙනි, යම්තාක් මේ ශාසනයෙහි ආශ්‍රවයන් ඉපිද සිටීමට ආධාර වූ ඇතැම් ආසවට්ඨානීය ධර්මයෝ සංඝයා කෙරෙහි නොපහළ වෙත් ද, ඒතාක් ශාස්තෘ තෙමේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද නොපණවයි. පාමොක් නොඋදෙසයි. ශාරිපුත්‍රයෙනි, යම්කලෙක වනාහි මේ ශාසනයෙහි ඇතැම් ආසවට්ඨානීය ධර්මයෝ සංඝයා කෙරෙහි පහළ වෙත් ද, එකල්හි ශාස්තෘ තෙමේ එම ආසවට්ඨානීය ධර්මයන් නැසීම පිණිස ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවයි. පාමොක් උදෙසයි."[13]

ශික්ෂාපද පැණවීමට හේතු ලෙස බුදුරදුන් දැක් වූ ආසවට්ඨානීය ධර්ම හතරක් පිළිබඳව තොරතොරු පාරාජිකපාළිය දක්වයි. එනම්,

1. සංඝො රත්තඤ්ඤු මහත්තං පත්තො හොති
2. සංඝො වෙපුල්ල මහත්තං පත්තො හොති
3. සංඝො ලාභග්ග මහත්තං පත්තො හොති
4. සංඝො බාහුසච්ච මහත්තං පත්තො හොති[14]

මේ හා සමාන ම ආසවට්ඨානීය ධර්ම පිළිබඳ තොරතොරු භද්දාලි සූත්‍රයේ දී ද, විස්තර කොට තිබේ. මෙහි ගණනින් ආසවට්ඨානීය ධර්ම පහකි. එනම්,

1. සංඝො මහත්තං පත්තො හොති
2. සංඝො යසග්ගං පත්තො හොති
3. සංඝො ලාභග්ගං පත්තො හොති

---

[13] ආගමෙහි ත්වං සාරිපුත්ත, ආගමෙහි ත්වං සාරිපුත්ත, තථාගතොව තත්‍ථ කාලං ජානිස්සති. න තාව සාරිපුත්ත සත්‍ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙති, න උද්දිසති පාතිමොක්ඛං. යාව න ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සංඝෙ පාතුභවන්ති. යතො ච ඛො සාරිපුත්ත ඉධෙකච්චෙ සික්ඛාපදං පඤ්ඤාපෙති, උද්දිසති පාතිමොක්ඛං. තෙසඤ්ඤෙව ආසවට්ඨානීයානං ධම්මානං පටිඝාතාය.
පා.පා, බු.ජ.මු, (1959) 22 පිට

[14] පා.පා, බු.ජ.මු, (1959) 22 පිට

4. සංඝො බාහුසච්චං පත්තො හොති

5. සංඝො රත්තඤ්ඤුතං පත්තො හොති[15]

භික්ෂූන් උදෙසා ශික්ෂාපද පැණවීමෙහි අරමුණු හා පරමාර්ථ විනය හා සූත්‍ර දේශනාවන්හි කිහිප තැනකදී ම දක්වා තිබේ. එහිදී විනයපෙය්‍යාල සූත්‍රයේ දී ශික්ෂාපද පැණවීමේ අපේක්ෂිත කරුණු යුගල වශයෙන් දහයක් දක්වා ඇත.

"ද්වෙ මෙ භික්ඛවෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං. කතමෙ ද්වෙ?

1. සංඝ සුට්ඨුතාය - සංඝයාගේ සුෂ්ඨුභාවය පිණිසය.
   සංඝ ඵාසුතාය - සංඝයාගේ ඵාසුභාවය පිණිසය.

2. දුම්මංකූනං පුග්ගලානං නිග්ගහාය - දුසිල් පුඟුලනට නිගා පිණිසය.
   පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය - පේශලමහණනුනට ඵාසුභාවය පිණිසය.

3. දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය - ඉහාත්මයෙහි ආශ්‍රවයන්ගේ සංවරය පිණිසය.
   සම්පරායිකානං ආසවානං පටිඝාතාය - පරලොව්හි ආශ්‍රවයන් වැළහීම පිණිසය.

4. දිට්ඨධම්මිකානං වෙරානං සංවරාය - ඉහතාත්මයෙහි වෛරයන්ගේ සංවරය පිණිසය.
   සම්පරායිකානං වෙරානං පටිඝාතාය - පරලොව්හි වෛරයන්ගේ වැළහීම පිණිසය.

5. දිට්ඨධම්මිකානං වජ්ජානං සංවරාය - ඉහතාත්මයෙහි දෝෂයන්ගේ සංවරය පිණිසය.
   සම්පරායිකානං වජ්ජානං පටිඝාතාය - පරලොව්හි දෝෂයන්හි වැළහීම පිණිසය.

---

[15] ම.නි ii, බු.ජ.මු. (1973) 186 පිට

6. දිට්ඨධම්මිකානං භයානං සංවරාය - ඉහතාත්මයෙහි බිය සංවරය පිණිසය.
සම්පරායිකානං භයානං පටිඝාතාය- පරලොව්හි බිය වැළැහීම පිණිසය.

7. දිට්ඨධම්මිකානං අකුසලානං සංවරාය - ඉහතාත්මයෙහි අකුසල් සංවරය පිණිසය.
සම්පරායිකානං අකුසලානං පටිඝාතාය - පරලොව්හි අකුසල් වැළැහීම පිණිසය.

8. ගිහීනං අනුකම්පාය - ගිහියනට අනුකම්පා පිණිසය.
පාපිච්ඡානං භික්ඛූනං පච්ඡෙදාය - පව්ටුභික්ෂූන්ගේ පක්ෂොපච්ඡේදය පිණිසය.

9. අප්පසන්නානං පසාදාය - අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිසය.
පසන්නානං භීයොභාවාය - ප්‍රසන්නයන්ගේ භීයෝභාවය පිණිසය.

10. සද්ධම්මට්ඨිතියා - සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිසය.
විනයානුග්ගහාය - විනයානුග්‍රහය පිණිසය.

ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තන්ති.[16]

මේ කරුණු ම පාරාජිකපාළියේ දස වැදෑරුම් කොට දක්වා තිබේ.[17]

විනය නීති පැණවූයේ එවැන්නක් අවශ්‍ය වූ අවස්ථාවකය. එනම්, භික්ෂුවක් විසින් වරදක් කළ පසුවය. නිරබ්බුද ශාසනයේ ප්‍රථමයෙන් ම අර්බුදයක් ඇති කරන ලද්දේ කලන්දකපුත්‍ර සුදින්න නම් භික්ෂුව විසිනි.

16 අං.නි i, බු.ජ.මු., (1960) 192 පිට

17 පා.පා., බු.ජ.මු., (1959) 54 පිට

"නිරබ්බුද වූ, නිරාදීන වූ, භික්ෂු සංඝයා අතරෙන් කලන්දකපුත්‍ර සුදින්න විසින් අර්බුදයක් උපදවන ලදි. ආදීනවයක් උපදවන ලදි."[18]

ශික්ෂාපද පැණවීමේ දී වරදට මුල් වූ පුද්ගලයා "ආදිකම්මිකයා" ලෙස සලකා ඔහු වරදින් නිදහස් කළේය. ඉන්පසු එම වරදෙහි යෙදෙන භික්ෂූහු වරදකරුවන් වූහ.

මෙසේ මුල්යුගයේ නිරබ්බුදව, නිරාදීනව බුදුරදුන්ගේ ප්‍රශංසාවට ලක් වූ භික්ෂු සංඝයා කල් ගතවත්ම අර්බුද, ආදීනවයන් ඇති කොට, විෂමාචාර හැසිරීම් ඇති වූවෝ බවට පත් වූහ. එවැනි අර්බුද කුමන සමාජයක වුව ද, පැන නැගීම සාධාරණ ධර්මතාවක් හෙයින් භික්ෂු සමාජයේ ද, අර්බුද ඇතිවීම ආශ්චර්ය, අද්භූත කාරණයක් සේ සැළකිය යුතු නොවේ.

---

[18] නිරබ්බුදො වත භො භික්ඛු සංඝො නිරාදීනවො. සුදින්නෙන කලන්දපුත්තෙන අබ්බුදං උප්පාදිතං. ආදීනවො උප්පාදිතො.
පා.පා, බු.ජ.මු, (1959) 42 පිට